# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
## நிதி, திட்டமிடல் அமைச்சு
## MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TTIP/01/2010/(1)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2011.08.08

ලේකම්
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

මහත්මයාණෙනි,

**සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම**

2010.12.10 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2010(1) හි 01 (ඉ) හා (ඊ) වගන්තිවල විශ්ව විද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අදාළ සේවා කාලය සංශෝධනය කරනු ලබන අතර, ඒ අනුව, විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලවල වසර 08 ක සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරීන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක වසර 08 ක සක්‍රීය සේවා කාලයක් ඇති විධායක නිලධාරීන් සහනදායී මෝටර් රථ බලපත්‍ර සඳහා හිමිකම් ලබනු ඇත.

02. ඉහත චක්‍රලේඛය යටතේ සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීමට අදාළ අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

03. ඒ අනුව, අදාළ අයදුම්පත් වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

මෙයට
විශ්වාසී,

පී.බී. ජයසුන්දර
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව